803

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/2023

5 වන මට්ටම - අවසාන පරීක්ෂණය

**EPU5256 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමා අයිතිවාසිකම්**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.02 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>I - වන කොටස</u>

01. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය (UNCRC) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. නිදහසින් පසු ශ්‍රී ලංකා රජය ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ක්‍රියාත්මක කළ වැදගත් ක්‍රියාමාර්ග **පහක් (05)** ලියන්න.

03. 1948 – 2019 කාලය තුළ ශ්‍රී ලංකාව විසින් සම්මත කරගනු ලැබූ ළමා සුභ සාධනයට අදාළ අඥා පනත් **පහක් (05)** නම් කරන්න.

04. විශේෂ තත්ත්වයන් යටතේ සිටින ළමයින් කවුරුන්දැයි නිර්වචනය කර එම ළමයින්ට රැකවරණය සැපයීමේදී රජයේ වගකීම් **තුනක් (03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

05. 1941 අංක 24 දරණ ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥා පනතේ සඳහන් සුවිශේෂී කරුණු **පහක් (05)** දක්වන්න.

06. ළමයින්ට අදාලව **"සහභාගිත්ව අයිතිය"** යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමෙන් අත්වන වාසි **පහක් (05)** ලියන්න.

08. පාසල් විවේක කාලයේදී ප්‍රාථමික සිසුන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳ ප්‍රාථමික පන්තිභාර ගුරුවරුන්ගේ වගකීම් **පහක් (05)** ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 02 - කොටස

09. (i.) **"ජීවත්වීමේ අයිතිය"** යනු කුමක්ද? (ලකුණු - 03)

(ii.) ප්‍රාථමික පාසල් වියේ දරුවන්ගේ **ජීවත්වීමේ** අයිතිය ඔවුන්ගේ නිවස තුළදී උල්ලංඝනය වන අවස්ථා **පහක් (05)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු - 05)

(iii.) තම දරුවන්ගේ ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීමට දෙමාපියන්ට ගතහැකි ක්‍රියාමාර්ග අවම වශයෙන් **පහක් (05)** සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු - 12)

10. (i.) **"ළමා අයිතිවාසිකම්"** යන්න නිර්වචනය කරන්න. (ලකුණු - 03)

(ii.) ශ්‍රී ලංකාවේ ළමයින්ගේ තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා ලන්දේසි යුගයේදී ගන්නා ලද පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 07)

(iii.) යටත්විජිත යුගයට පෙර ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැවැති තත්ත්වය සහ වර්තමානයේ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පවතින තත්ත්වය සංසන්දනය කරන්න. (ලකුණු - 10)

11. (i.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් සිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය නංවාලීමට ප්‍රාථමික ගුරුවරයෙකු ලෙස ඔබට කළ හැකිදේ කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(ii.) ඉහත සඳහන් ක්‍රියාමර්ග ක්‍රියාත්මක කිරීමේ දී ඔබට මුහුණ දිය හැකි අභියෝග **පහක් (05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(iii.) "වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය ප්‍රාථමික පාසල් සිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකර ඇත."

ඔබ මෙම වගන්තිය සමඟ **එකඟවන්නේද? නොවන්නේද** යන්න සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 10)

12. "මෑත කාලීනව ලෝකය පුරාම ළමයින්ගේ **සුරක්ෂණ අයිතිය** බරපතල ලෙස තර්ජනයට ලක්වී ඇත."

(i.) සුරක්ෂණ අයිතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු - 03)

(ii.) ළමයින්ගේ සුරක්ෂණ අයිතිය තර්ජනයට ලක්විය හැකි අවස්ථා **තුනක් (03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 07)

(iii.) වර්තමානයේ ලෝකයේ ප්‍රාථමික පාසල් සිසුන්ගේ සුරක්ෂණ අයිතිය සුරැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගතහැකි ක්‍රියාමාර්ග අවම වශයෙන් **පහක් (05)** යෝජනා කරන්න. (ලකුණු - 10)

13. (i.) ශ්‍රී ලංකාවේ මහජනතාවගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් භාවය ඉහළ නැංවීමේ දී ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන්හි දක්නට ලැබෙන දුර්වලතා අවම වශයෙන් **තුනක් (03)** සඳහන් කරන්න. (ලකුණු - 03)

(ii.) එම දුර්වලතා ඇතිවීමට බලපාන හේතු මොනවාද? නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 07)

(iii.) ඔබ ඉහත පිළිතුරෙහි සඳහන් කළ දුර්වලතා මගහරවා ගැනීමට ගතයුතු නිර්මාණශීලී යෝජනා **තුනක් (03)** සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 10)

- සියළුම හිමිකම් ඇවිරිණි. -